(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 98.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 සැප්තැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

487/'16

1\.

ගරු කනක හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂය අවසන් වනවිට රට තුළ සිටි රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2016 වර්ෂයේදී එම උපාධිධාරීන්ගෙන් කොපමණ සංඛ්‍යාවකට රජයේ රැකියා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) ඉතිරි උපාධිධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රැකියා විරහිත උපාධිධාරීන් පෞද්ගලික අංශයෙහි රැකියා අවස්ථාවන් සඳහා යොමුකිරීමට යම් සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, එම සැලැස්ම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

643/'16

2\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල අධ්‍යාපන කලාපයට අයත්, මො/අලුපොත මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය ද්විතියික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කිරීමේදී, එහි ප්‍රාථමික අංශය වෙන්කරන ලද බවත්;

(ii) වර්ෂ 2013 දී, මො/අලුපොත මුස්ලිම් ප්‍රාථමික විද්‍යාලය ලෙස නම් කරන ලද එම පාසල සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් හෝ අවශ්‍ය භෞතික සම්පත් ඇතුළු සුදුසු ගුරු මණ්ඩලයක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ප්‍රාථමික පාසල සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට, අවශ්‍ය භෞතික සම්පත් ලබාදීමට සහ සුදුසු ගුරු මණ්ඩලයක් පත්කිරීම සඳහා කඩිනම් පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

705/'16

3\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සමහර ඩිපෝවල 2016 මාර්තු මස වැටුප් 2016 අප්‍රේල් මස 28 දින දක්වාම නොගෙවා සිටි බව දන්නේද;

(ii) සිය සේවකයන් සියලුදෙනාගේ 2016 මාර්තු මස වැටුප් නියමිත දිනට සම්පූර්ණයෙන් ලබා දීමට අසමත් වූ ඩිපෝ කවරේද;

(iii) ඉදිරියේදී නියමිත දිනට වැටුප් ලබා දෙන බව සහතික වීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

733/'16

4\.

ගරු බිමල් රත්නායක මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල කොළඹ දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

782/'16

5\.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2014 දක්වා, ශ්‍රී ලංකා රජය ලද විදේශ ප්‍රදානයන්හි රුපියල් වටිනාකම, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙහි උපකල්පිත විදේශ ප්‍රදාන ප්‍රමාණය කොපමණද;

(iii) 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා රජය ලද මුළු විදේශ ප්‍රදාන ප්‍රමාණය කොපමණද;

(iv) 2015 වර්ෂයේදී විදේශ ප්‍රදානයන් අඩුවීම කෙරෙහි බලපෑ හේතූන් කවරේද;

(v) 2016 වර්ෂයේදී අපේක්ෂිත විදේශ ප්‍රදානයන් පිළිබඳව ශුභවාදී ධනාත්මක වෙනසක් අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

783/'16

6\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුසියාවේ, හිටපු ශ්‍රී ලංකා තානාපති උදයංග වීරතුංග මහතාට හා ඔහුගේ බිරිඳට නිකුත් කර තිබූ රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍ර අවලංගු කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඔහුට හා ඔහුගේ බිරිඳට සාමාන්‍ය ගමන් බලපත්‍ර නිකුත් කර තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) ඒ සඳහා විදේශ අමාත්‍යාංශය විසින් ආගමන හා විගමන පාලක ජනරාල් වෙත යම් නිර්දේශයක් ලබා දී තිබේද;

(vi) එසේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

(vii) ඔවුන් දෙදෙනාට නිකුත් කළ සාමාන්‍ය ගමන් බලපත්‍ර ලබාගැනීමට උදයංග වීරතුංග මහතා ශ්‍රී ලංකාවට පැමිණියේද;

(viii) නොඑසේ නම්, එම ගමන් බලපත්‍ර භාරගන්නා ලද්දේ කවුරුන් විසින්ද;

(ix) එම ගමන් බලපත්‍ර භාරගන්නා ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

788/'16

7\.

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11හි, මෙතෙක් පරිපාලන කටයුතු සිදුවී ඇත්තේ පැරණි සීමා මායිම්වලට අනුකූලව වන අතර, 1992 අංක 58 දරන බලතල පැවරීමේ පනත හා 1996.08.02 දිනැති අංක 935 දරන ගැසට් පත්‍රයට අනුව නව මායිම් සලකුණු කරමින් පවතින බවත්;

(ii) එමඟින්, පදවි ශ්‍රීපුර කොට්ඨාසයේ, 31J සිංහපුර, 31F පරණ මැදවච්චිය සහ 31M සමන්පුර යන ග්‍රාම නිලධාරි වසම් කොට්ඨාස දෙකකට බෙදෙන බවත්;

(iii) ගෝමරන්කඩවල කොට්ඨාසයේ, 233C මයිලවැව ග්‍රාම නිලධාරි වසමේ කොටසක්ද, සේරුවිල කොට්ඨාසයේ, සමහර කොටස්ද වෙනත් කොට්ඨාසවලට බෙදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පැරණි පරිපාලන බෙදීම් අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොට්ඨාස 11ට බෙදී තිබූ ග්‍රාම නිලධාරි වසම් හා ගම්මාන කවරේද;

(ii) අ(i) සඳහන් පනතට අනුව මායිම් යළි සලකුණු කිරීමේදී වෙනත් කොට්ඨාසයකට අයත් වූ ග්‍රාම නිලධාරි වසම්/ගම් කවරේද;

(iii) දැනට ක්‍රියාත්මක සීමා නිර්ණ කමිටු තීරණ අනුව, අලුතින් කොට්ඨාස මායිම් සලකුණු කරන්නේද;

(iv) එසේ නම්, එම පදනම කවරේද;

(v) ඒ සඳහා එක් එක් කොට්ඨාසයේ පදිංචිකරුවන්ගේ එකඟත්වය විමසන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

792/’16

8\.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.10 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාව තුළ ආයෝජනය සඳහා පැමිණි විදේශ ව්‍යාපාරිකයන් සංඛ්‍යාව සහ ආයෝජිත මුළු මුදල ඇමරිකානු ඩොලර් කොපමණද;

(ii) ආයෝජකයාගේ රට, විදේශ ව්‍යාපාර ආයතනයේ නම, ලිපිනය සහ ආයෝජිත මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ එකී ආයෝජන ව්‍යාපෘති පිහිටා ඇති ප්‍රදේශ හා ආයෝජන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට ඒ ඒ ව්‍යාපෘතිවල සේවය කරන ශ්‍රී ලාංකික සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආයෝජනයට ප්‍රථම අදාළ ආයෝජකයා ලබාදීමට එකඟ වූ රැකියා සංඛ්‍යාව සහ සැපයූ රැකියා සංඛ්‍යාව අතර පරස්පරයන් ඇති ව්‍යාපෘති කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම සඳහා අදාළ පහසුකම් ලබාගෙන හෝ ගිවිසුම්වලට එළඹුනු නමුත්, මේ දක්වා සිය ව්‍යාපෘති ආරම්භ නොකළ ආයෝජකයන් සිටින්නේද;

(iv) එසේ නම්, අදාළ ආයෝජකයාට හෝ සමාගමට පිරිනමා ඇති පහසුකම් කවරේද;

(v) 2012, 2013 සහ 2014 යන වර්ෂවලදී ශ්‍රී ලංකාව තුළ මුළු විදේශ ආයෝජනය වෙන් වෙන් වශයෙන් ඇමරිකානු ඩොලර්වලින් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

800/’16

9\.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) “ළඟම පාසල හොඳම පාසල” වැඩසටහනට ඇතුළත් මුලතිව් අධ්‍යාපන කලාපයට අයත් පාසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මුලතිව් අධ්‍යාපන කලාපය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් ඇති නමුත්, එම කොට්ඨාසවල පිහිටි බොහෝ පාසල් “ළඟම පාසල හොඳම පාසල” වැඩසටහනට ඇතුළත්කර නොගෙන නොසලකා හැර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) (ආ) හි සඳහන් කර ඇති පරිදි පාසල් නොසලකා හැරීමට හේතුව කවරේද;

(ii) මුලතිව් අධ්‍යාපන කලාපයේ නොසලකා හැර ඇති පාසල්, “ළඟම පාසල හොඳම පාසල” වැඩසටහනෙහි නිර්ණායකයන්ට අනුව ඇතුළත්කර ගැනීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

809/'16

10.

ගරු වමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ,

(i) නම්;

(ii) තනතුරු;

(iii) අධ්‍යාපන සුදුසුකම්;

(iv) වැටුප් හා අනෙකුත් දීමනා;

(v) විදේශ සංචාරවල නිරත වී ඇත්නම්, එම සංචාර සඳහා දරන ලද වියදම;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සංචාර සඳහා පළාත් සභා අරමුදල් යොදාගෙන තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

814/'16

11.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පාලනය නොකරනු ලබන කැළෑ 2001 වර්ෂයට පෙර ප්‍රාදේශීය ලේකම් / සහකාර ආණ්ඩුවේ ඒජන්ත / ප්‍රාදේශීය ආදායම් නිලධාරි යටතේ පාලනය වූ බවත්;

(ii) අංක 05/2001 චක්‍රලේඛය යටතේ මෙම සියලුම ඉඩම් වන සංරක්ෂක වෙත පැවරූ බවත්;

(iii) රජයේ කඩිනම් අවශ්‍යතාවයන් සඳහා අත්‍යාවශ්‍ය ඉඩම් අංක 05/2001 චක්‍රලේඛයෙන් නිදහස් කිරීම සඳහා අංක 02/2006 යටතේ චක්‍රලේඛයක් නිකුත් වූ බවත්;

(iv) රජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා ඉඩම් නිදහස් කිරීම, දිසාපතිවරයා දිස්ත්‍රික් ලේකම්වරයාගේ මූලිකත්වයෙන් පිහිටුවන ලද කමිටුවක් මඟින් සිදු කිරීම සඳහා අංක 02/2006 චක්‍රලේඛයෙහි විධිවිධාන සලසා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) අංක 05/2001 සහ අංක 02/2006 චක්‍රලේඛ සහාගත කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

815/'16

12.

ගරු ප්‍රසන්න රණවීර මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) තත්ත්වයෙන් ඉහළ ගුණාත්මක භාණ්ඩ ලබාගත හැකි දීපව්‍යාප්ත අළෙවි ජාලයක් සහිත රාජ්‍ය ආයතනයක් ලෙස සමූපකාරය ක්‍රියාත්මක වන බවත්;

(ii) ආපදා අවස්ථාවලදී මහජනතාව වෙත සහනාධාර ලබාදීම සඳහා සමූපකාරය ප්‍රධානතම ආයතනයක් ලෙස භාවිතා කරනු ලබන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ගැබිණි මව්වරුන් සඳහා ක්‍රියාත්මක "පෝෂණ මල්ල" ව්‍යාපෘතිය සමූපකාරය මෙන්ම, වෙනත් ආයතන හරහා ද ක්‍රියාත්මක වන බවත්;

(ii) එම ව්‍යාපෘතිය සමූපකාරය හරහා පමණක් ක්‍රියාත්මක කළේ නම්, මීට වඩා වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා දිය හැකි බවත්;

(iii) එමඟින් සමූපකාරයේ ආදායම ඉහළ නැංවිය හැකි බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) (i) සමූපකාරය සහ වෙනත් ආයතන හරහා ඉහත ව්‍යාපෘතිය යටතේ මේ වනවිට බෙදාහැර ඇති ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(ii) රාජ්‍ය මැදිහත්වීමක් හා විධිමත් අධීක්ෂණයක් යටතේ පවතින සමූපකාර ව්‍යාපාරය හරහා විශාල පිරිසකට ප්‍රතිලාභ ලැබෙන පරිදි පෝෂණ මල්ල ලබාදීමේ වැඩසටහන දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබියදී, වෙනත් පෞද්ගලික ආයතන හරහා එය ක්‍රියාත්මක කරන්නේ මන්ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

817/'16

13.

ගරු විමලවීර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ හෝ තදාසන්න ප්‍රදේශවල විවිධ සේවාවන්හි යෙදවීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සෙබළුන් පිට පළාත්වලින් කැඳවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ කැඳවා විවිධ සේවාවන්හි යොදවන සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සෙබළුන්ගෙන් යම් පිරිසකට වැටුපට අතිරේකව යැපීම් දීමනාවක් ගෙවන බවත්;

(ii) එම සේවාවන්ට හා තත්ත්වයන්ට සමානව සේවයේ යොදවනු ලබන තවත් සෙබළුන් පිරිසකට එම දීමනාව නොගෙවන බවත්;

(iii) ඒ අනුව සමාන සේවාවන් හා සමාන තත්ත්වයන් යටතේ එකී සෙබළුන් පිරිසට වෙනස් ආකාරයට සැලකීම අසාධාරණ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එසේ අසාධාරණයට ලක්වන සෙබළුන්ට සාධාරණ යැපීම් දීමනාවක් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා ද විය යුතුය. පූ. භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 63 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්පත් කර ගැනීමේ (වන්දි ගෙවීමේ) නියෝග සංශෝධනය සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 26 දිනැති අංක 1977/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 26 දිනැති අංක 1968/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 13 දිනැති අංක 1971/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 13 දිනැති අංක 1971/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 3),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජුනි 28 දිනැති අංක 1973/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 4),—1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජුලි 12 දිනැති අංක 1975/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 147 — වැඩසටහන 1,— † 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ ''අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට'' මාරුකර ගැනීමටත් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6.1 හා 6.2 වගන්ති මඟින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යකරණ සහිතව ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යකරණය කරන ලද රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් (රු.592,925,000) නොඉක්මවන මුදලක් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගත යුතු ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 147 | - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 1 | - මෙහෙයුම් වැඩසටහන | |
| පුනරාවර්තන වියදම් | - | | රු. 469,425,000 |
| මූලධන වියදම් | - | | රු. 123,500,000 |
| | | මුළු වියදම = | **රු. 592,925,000** |

(රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් පමණි.)

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ''බී'' ගිණුම**

| | |
|---|---|
| උපරිම වියදම් සීමාව | - රු. 2,000,000 |
| අවම ලැබීම් සීමාව | - රු. 150,000 |
| උපරිම හර ශේෂ සීමාව | - රු. 3,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 55,000,000.

*13.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධුරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඇ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— “ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*16.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

19\.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**